**ප්‍රසිද්ධ දැන්වීමයි**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයේ පුරප්පාඩු**

**පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමෙන් පසු අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයේ වසර 03 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතුය.

| | තනතුර |
|---|---|
| 1 | භෝජනාගාර සේවක |
| 2 | මුරකරු |

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් 2013.05.27 දින අනුමත කර ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව බඳවා ගැනීම සඳහා අදාල කොන්දේසි පහත සඳහන් කර ඇත.

02. තනතුරේ ස්වාභාවය :- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වේ.

සේවා ගණය :- ප්‍රාථමික ශිල්පීය නොවන

බඳවා ගන්නා ශ්‍රේණිය :- 111 ශ්‍රේණිය

වැටුප් ඛණ්ඩය :- PL 1 – 2006 (A)

වැටුප් පරිමාණය :- 24250-250-10-270-10-300-10-330-12-36410/-

2020.01.01 දින දක්වා වැටුප් වර්ධක හා දීමනා ගෙවනු ලබන්නේ රා.ප.ච. 3/2016 හි විධිවිධාන වලට අනුකූලවය.

අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් <u>06 කට නොඅඩුව, යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව සමත්ව තිබිය යුතුය.</u>

03. වයස් සීමාව :- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

04. පොදු කොන්දේසි :-

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.

11. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

111. දණ්ඩ නීති පනත යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබුවකු හෝ රජයේ / පළාත් රාජ්‍ය සේවයෙන් පහ නොකරනු ලැබුවකු විය යුතුය.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :-

1. අදාළ තනතුර සඳහා වන PL -1 බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙලට හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනේ.

11. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍රයන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ඇත.

1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්
2. අදාළ කේෂත්‍රය තුල ලබා ඇති පුහුණුව හා සහතික පත්‍ර
3. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද
4. භාෂා ප්‍රවීණතාවය
5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා

06. ඉල්ලුම් කරන ආකාරය :-

අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුවය. නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.01.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර එවිය යුතුය. එක් අයදුම්කරුවකු තනතුරු කීපයක් සඳහා අයදුම් කරන්නේනම්, අදාල අයදුම්පත් වෙන වෙනම කවරවල බහා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු ලිපිනය :-

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,

පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු , සාමදාන විනිශ්චයකාරවරයකු , දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරිවරයකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. අයදුම්පත් සමඟ අධ්‍යාපන සුදුසුකම් හා තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් සනාථ වන ලේඛණයන්හි ඡායාපිටපත් එවීම අත්‍යාවශය වේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් කරනු ලබන්නේ නම් හා පත්වීම් බලධාරියා ඉල්ලුම් කරන ඕනෑම අවස්ථාවක සහතිකපත් වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

09. ඉහත සඳහන් කොන්දේසි සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දිනය:-2016. ......... . .......

ආචාර්ය ආර්.ආර්.ඒ. විජේකෝන්,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

කාර්යාල ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**ආදර්ශ අයදුම්පත**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1-2006A) තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම 2016**

01. ඉල්ලුම් කරනු ලබන තනතුර : (ඉල්ලුම් කරන තනතුර හා තනතුරේ අංකය කොටුව තුල ලියන්න)

| | |
|---|---|
| 1 | භෝජනාගාර සේවක |
| 2 | මුරකරු |

| ඉල්ලුම් කරන තනතුර | තනතුරු අංකය |
|---|---|
| | |

02. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :-

……………………………………........................................................................................... මයා / මිය / මෙනවිය

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා :**PERERA A.B**)

.................................................................................................................................. Mr / Mrs / Miss

03. මුල් අකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :-

...........……………………………………………..................................................................................................

(ඉංග්‍රීසියෙන්)

..................................................................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. උපන් දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

06. 2016/......./... දිනට වයස :-

| අවුරුදු | | | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

07. ස්ත්‍රී / පුරුෂ භාවය :-

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|

(අදාල නොවන කොටුව කපන්න)

08. පෞද්ගලික ලිපිනය :- (මෙය ඔබට කැඳවීමේ ලිපිය ලැබෙන ලිපිනය විය යුතුය)

..................................................................………........................................................................

09. පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................................................................

10. සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය :- ...............................................................

11. අධ්‍යාපන සුදුසුකම් :-

11.1 මූලික සුදුසුකම් (අ.පො.ස.) සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ( සහතික වල ජායා පිටපත් අමුණා එවිය යුතුය)

වර්ෂය :- .................................

පළමු වර | | | දෙවන වර | |

| | විෂය | සාමාර්ථය | | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |
| 9 | | | 9 | | |
| 10 | | | 10 | | |

11.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :-

| | | |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

12. භාෂා ප්‍රවීනතාවය :-

12.1 දෙමළ / සිංහළ කියැවීමේ ලිවීමේ හැකියාව :-

| විභාගය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |

13. අදාල ක්ෂේත්‍රයේ පලපුරුද්ද :-

14. වෙනත් තොරතුරු :-

.........................................................................................................................................................
..................................................................................................................................

15. අයදුම්කරුගේ සහතිකය :-

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ වන සහතික වල ඡායා පිටපත් මේ සමඟ අමුණා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවුත් නිවැරදි වුත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස්සකුවීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

දිනය ......................
...............................................

අයදුම්කරුගේ අත්සන

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරිම :-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................ යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

.................................................................

දිනය ........................ අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-

තනතුර :-

ලිපිනය :-

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවුවන් සඳහා (අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරුට/අයදුම්කාරියට මෙම තනතුරට ඉල්ලුම් කිරීමට අදාල සුදුසුකම් ඇති/නැති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව සලකා බලනු ලබන බවත් සහතික කරමි.

...................................... .....................................................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාව)